# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2128/15 – 2019 ජුනි 19 වැනි බදාදා – 2019.06.19**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2019 අංක 122 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/6/2019/HW/36.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: DEV/LND/02/ACQUI/05-11.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2019 ජුනි මස 17 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, දෙවිනුවර.

2. **ඉඩමේ විස්තරය.–** දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලබඩ පත්තුව සුළු කොට්ඨාසයේ පල්ලෙ අපරැක්ක (හිගුරුපත්තල) ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක MR/DVN/RDA/2019/189 හා 2019.04.02 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – බඳුවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0063**

උතුරට: මු.පි.මාර 2724 හි කැබලි අංක 31; නැගෙනහිරට: මු.පි.මාර 2724 හි කැබලි අංක 33 මෙම අනුරේඛනයේ සහ කැබලි අක්ෂර බී; දකුණට: සී. ඩී. ඒ. රාසපුත්‍ර හිමිකම් කියන බදුවත්ත සහ ආර්. ආර්. රාසපුත්‍ර හිමිකම් කියන බදුවත්ත; බටහිරට: ආර්. ආර්. රාසපුත්‍ර හිමිකම් කියන බදුවත්ත.

02. **කැබලි අක්ෂර 'බී' – බඳුවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0276**

උතුරට: කැබලි අක්ෂර ඒ, මු.පි.මාර 2724 හි කැබලි අංක 31 සහ 33; නැගෙනහිරට: මු.පි.මාර 2724 හි කැබලි අංක 33; දකුණට: සී. ඩී. ඒ. රාසපුත්‍ර හිමිකම් කියන බදුවත්ත; බටහිරට: සී. ඩී. ඒ. රාසපුත්‍ර හිමිකම් කියන බදුවත්ත, ආර්. ආර්. රාසපුත්‍ර හිමිකම් කියන බදුවත්ත සහ කැබලි අක්ෂර ඒ.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

03. **කැබලි අක්ෂර 'සී' – ඊජ්වරගේ වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0136**

උතුරට: මු.පි.මාර 2724 හි කැබලි අංක 35; නැගෙනහිරට: මු.පි.මාර 2724 හි කැබලි අංක 35, 42 සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර ඩී; දකුණට: මු.පි.මාර 2724 හි කැබලි අංක 43 සහ 41; බටහිරට: මු.පි.මාර 2724 හි කැබලි අංක 41 සහ 35.

04. **කැබලි අක්ෂර 'ඩී' – කල්දේරම් වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0039**

උතුරට: කැබලි අක්ෂර සී, මු.පි.මාර 2724 හි කැබලි අංක 35 සහ 42; නැගෙනහිරට: මු.පි.මාර 2724 හි කැබලි අංක 42; දකුණට: මු.පි.මාර 2724 හි කැබලි අංක 43; බටහිරට: මු.පි.මාර 2724 හි කැබලි අංක 43 සහ 41.

07 - 39

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.